8 – ශ්‍රේණිය

# බොදු පුනරුදයේ සෙන්පතියාණෝ

20

- ❖ නිපුණතාව - සංස්කෘතිය හා සාරධර්ම හඳුනා ගනිමින් සහජීවනය හා ජාතිකාභිමානය ගොඩනගා ගැනීම සඳහා භාෂාව භාවිත කරයි .
- ▪ නිපුණතා මට්ටම - විවිධ නායකයන්ගේ චරිත කථා පරිශීලනය කරයි .
- ❖ නිපුණතාව -භාෂාව නිරවුල් ව හා නිවැරදි ව භාවිත කරමින් නිර්මාණාත්මක ලේඛනයේ යෙදෙයි .
- ▪ නිපුණතා මට්ටම - කරුණු සංවිධානය කර ගනිමින් මාතෘකානුකූල ව රචනා ලියයි .
- ❖ නිපුණතාව - ශිල්පීය ප්‍රයෝග භාවිත කරමින් නිවැරදි ව ලේඛන කාර්යයේ යෙ
- ▪ නිපුණතා මට්ටම - පද බෙදීමේ රීති අනුගමනය කරමින් ලියයි .



# ක්‍රියාකාරකම - 1

➢ පහත දැක්වෙන ඡේදය කියවා දී ඇති තොරතුරු පත්‍රිකාව සම්පූර්ණ කරන්න .

1823පෙබරවාරි මස 9 වනදා මෙළොව එළිය දුටු මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන් ගේ ගිහිකල නාමය වූයේ ගිංගම ලද්දූ මිගෙල් මැන්දිස් ය . මෙම හිමියන් උපත ලැබුවේ , බලපිටියේ මොහොට්ටිවත්තේදී ය .

මෙම හිමියන්ගේ මව මිල්ඩෝ ද සිල්වා මැතිනිය යි . පියා ගිංගම ලද්දූ අසනේරිස් මැන්දිස් මහතා ය.පූජකවරයෙකුගේ මග පෙන්වීම යටතේ ඉතා හොඳින් සිංහල සහ ඉංග්‍රීසි භාෂා දැනුම ලබා ගත් ලද්දූ මිගෙල් මැන්දිස් කුමරා කොළඹ වෙස්ලි විද්‍යාලයට ඇතුළත්ව වැඩි දුරටත් ඉංග්‍රීසි භාෂාව හැදෑරුවේ ය .එපමණක් නොව සුධර්මාරාම ගුණරතන හිමියන් යටතේ සිංහල , සංස්කෘත හා බුද්ධධර්මය මැනවින් ප්‍රගුණ කළේය .

- **උපන් දිනය -**
- **උපන් ස්ථානය -**
- **ගිහිකල නම -**
- **මවගේ නම -**
- **පියාගේ නම -**
- **අධ්‍යාපනය ලැබූ පාසල -**
- **උගත් භාෂා -**

# ක්‍රියාකාරකම - 2

➢ ගුණානන්ද හිමියන් සම්බන්ධ පහත කරුණු කියවා දී ඇති මාතෘකා ඔස්සේ වෙන් කර ලියන්න .

1.ධර්ම දේශනා පැවැත්වීම
2. පෙරහැර සංවිධානය
3. ඉගෙනීමේ දක්ෂ බව
4. බෞද්ධ පාසල් පිහිටු වීම
5.කතාවෙහි චතුර බව
6. පුස්කොළ පොත් සම්පාදනය
7. බෝධිරාජ සමිතිය පිහිටුවා බෝධි වෘක්ෂ රෝපණය
8. විවිධ භාෂා පිළිබඳ දැනුම
9.සුමධුර ලෙස ධර්මය දේශනා කිරීම
10. ඕනෑම කටයුත්තක් මනාව සංවිධානය කිරීම

**හිමියන් සතු දක්ෂතා**

**ශාසනික සමාජ මෙහෙවර**

# ක්‍රියාකාරකම - 3

- ***ගුණානන්ද හිමියන් විසින් රචිත ග්‍රන්ථ සොයා යටින් ඉරක් අඳින්න.***

1. අමාවතුර
2. ගම්පෙරළිය
3. ක්‍රිස්තියානි වාද විසාතතිය
4. මඩොල් දූව
5. රිවි රැස
6. දිණමිණ
7. සද්ධර්මරත්නාවලිය
8. බුද්ධ ඇදහිල්ල
9. බැද්දේගම
10. සිරිත් මල්දම

# ක්‍රියාකාරකම - 4

- පංචමහාවාද පැවැත්වූ වර්ෂ සොයා යා කරන්න .

| | |
|---|---|
| ❑ බද්දේගම වාදය | 1866 |
| ❑ වරාගොඩ වාදය | 1865 |
| ❑ උදම්මිට වාදය | |
| ❑ ගම්පොළ වාදය | 1871 |
| ❑ පානදුරා වාදය | 1873 |

# ක්‍රියාකාරකම - 4
# පිළිතුරු



| වාදය | වර්ෂය |
|---|---|
| බද්දේගම වාදය | 1865 |
| වරාගොඩ වාදය | 1865 |
| උදම්මිට වාදය | 1866 |
| ගම්පොළ වාදය | 1871 |
| පානදුරා වාදය | 1873 |

# ක්‍රියාකාරකම - 5

➢ ***පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න .***

රචනාව ප්‍රධාන ආකාර දෙකකි .මාතෘකානුකූල රචනා සහ ඡේදයක් දී එහි ඇති තොරතුරුවලට අනුව මාතෘකාවක් යොදා රචනා ලිවීම යනු එම කොටස් දෙකයි .රචනා ලිවීමේ අරමුණ වන්නේ දෙනු ලබන මාතෘකාවක් යටතේ කරුණු පිළිවෙළට ක්‍රමානුකූලව පෙළ ගැස්වීමයි .චරිත කතා පදනම් කරගෙන රචනා ලිවීමේදී නිශ්චිත කරුණු දැක්වීම අත්‍යවශ්‍ය වේ . එමෙන්ම යහපත් සමාජයක් ගොඩනගා ගැනීම සඳහා කැපවුණු චරිත මාතෘකා කර ගැනීමට වග බලා ගත යුතුය.රචනයක් ලිවීමේදි අවධානය යොමු කළ යුතු දේවල් රාශියකි . නිවැරදිව වාක්‍ය ලිවීම , ආකර්ෂණීය ආරම්භයක් ගැනීම ,නිවැරදි පද බෙදීම් , නිවැරදිව ඡේද වෙන් කිරීම ,නිවැරදි විරාම ලකුණු යෙදීම, පැහැදිලිව අත් අකුරු ලිවීම සහ සාර්ථක අවසානයක් යෙදීම යනු එම කරුණු කිහිපයකි .

1. රචනාවක් ලිවිය හැකි ප්‍රධාන ආකාර දෙක සඳහන් කරන්න .
2. රචනාවක් ලිවීමේ අරමුණ කුමක් ද ?
3. චරිත කතාවක් පදනම් කරගෙන රචනා ලිවීමේදී සැලකිලිමත් විය යුතු කරුණක් ලියන්න
4. රචනාවක් ලිවීමේදි සැලකිලිමත් විය යුතු බවට දක්වා ඇති කරුණු සියල්ල ලියන්න .

# ක්‍රියාකාරකම - 5
# පිළිතුරු



1. රචනාවක් ලිවිය හැකි ප්‍රධාන ආකාර දෙක සඳහන් කරන්න . මාතෘකානුකූල රචනා සහ ඡේදයක් දී එහි ඇති තොරතුරුවලට අනුව මාතෘකාවක් යොදා රචනා ලිවීම
2. රචනාවක් ලිවීමේ අරමුණ කුමක් ද ? දෙනු ලබන මාතෘකාවක් යටතේ කරුණු පිළිවෙළට ක්‍රමානුකූලව පෙළ ගැස්වීමයි
3. චරිත කතාවක් පදනම් කරගෙන රචනා ලිවීමේදී සැලකිලිමත් විය යුතු කරුණක් ලියන්න නිශ්චිත කරුණු දැක්වීම අත්‍යවශ්‍යය වේ .
4. රචනාවක් ලිවීමේදි සැලකිලිමත් විය යුතු බවට දක්වා ඇති කරුණු සියල්ල ලියන්න . නිවැරදිව  වාක්‍ය ලිවීම , ආකර්ෂණීය ආරම්භයක් ගැනීම ,නිවැරදි පද බෙදීම් , නිවැරදිව ඡේද වෙන් කිරීම ,නිවැරදි විරාම ලකුණු යෙදීම, පැහැදිලිව අත් අකුරු ලිවීම සහ සාර්ථක අවසානයක් යෙදීම යනු එම කරුණු කිහිපයකි .

# ක්‍රියාකාරකම - 4

- නිවැරදි පද බෙදීම් සහිත පද තෝරා අදාළ රවුම යටින් ඉරක් අඳින්න.

- ගෙවල් වල
- දුබල
- නො මිනිස්
- පාරවල්
- සතුන්ගෙන්
- ගෙවල්වල
- අනුගමනය
- සතුන් ගෙන්
- වනයෙ හි
- අනු ගමනය
- නොමිනිස්
- පාර වල්
- ධනවත්
- ධන වත්
- දු බල
- වනයෙහි

# ක්‍රියාකාරකම - 5

➢ **නිවැරදි පද බෙදීම් සහිත වාක්‍ය ඉදිරියෙන් ‘ හරි ’ ලකුණත් වැරදි වාක්‍ය ඉදිරියෙන් ‘ වැරදි ’ ලකුණත් යොදන්න .**

1. නිවහල් දේශයක් ගොඩ නැගීමට අපි ඇප කැප වෙමු . ☐
2. සතුන් ගෙන් ගහණ වනාන්තරයේ අපි ඇවිද ගියෙමු . ☐
3. ලූලා නැති වලට කණයා පණ්ඩිතයාලු . ☐
4. විල්වල මානෙල් මල් පිරී තිබුණි . ☐
5. මහ වැස්ස නිසා ගස් වලට නව පණක් ලැබුණි . ☐
6. දූ සිරිත් වලින් ඈත් වීම යහපත් සමාජයකට මහත් පිටිවහලකි . ☐
7. සුසිරිත් රැකීම අප විසින් නොවරදවා ම කළ යුත්තකි. ☐
8. වනයෙහි පිපි මල් පරිසරය අලංකාර කරයි . ☐
9. සඳ යි තරු යි රාත්‍රී අහසේ චමත්කාරජනක දසුනකි . ☐
10. ගෙවල්වලට ගොස් පලතුරු විකිණීමෙන් ඔහු ජීවත් වෙයි . ☐

# ක්‍රියාකාරකම - 6

- පහත වාක්‍ය ඉදිරියෙන් හරි නම් හරි ලකුණත් වැරදි නම් වැරදි ලකුණත් යොදන්න .

1. සමරූපතාවෙන් යනු එක් ලේඛනයක දී සැම තැන්හි ම එක් ක්‍රමයක් අනුව ලිවීමයි .
2. සංඛ්‍යා වචනයෙන් ලියන විට පද බෙදීම පිළිබඳව සැලකීමක් අවශ්‍ය නැත .
3. සියයෙන් පහළ සංඛ්‍යා එක් කොට ම ලිවිය යුතුය
4. සියයෙන් පහළ සංඛ්‍යා එක් කොට හෝ සමරූපතාවෙන් ලිවිය හැකිය .
5. හයදහස් හයසිය තිහ යන්න හය දහස් හය සිය තිහ ලෙසද ලිවිය හැකිය .
6. ඉලක්කමෙන් සංඛ්‍යාවක් ලියන විට විභක්ති අකුරත් සමගම ලිවිය යුතුය .

# ක්‍රියාකාරකම - 7
## පසු වැඩ

❖ පහත දැක්වෙන මාතෘකා ඔස්සේ රචනා ලියන්න

1 . අනගාරික ධර්මපාල තුමා

2. කුමාරතුංග මුනිදාසයන්

3. මාර්ටින් වික්‍රමසිංහ මහතා

4. රබින්ද්‍රනාත් තාගෝර් තුමා

5.එදිරිවීර සරච්චන්ද්‍ර මහතා

# ක්‍රියාකාරකම - 1
# පිළිතුරු



- උපන් දිනය - 1823 පෙබරවාරි 9
- උපන් ස්ථානය - බලපිටියේ මොහොට්ටිවත්ත
- ගිහිකල නම - ගිංගම ලද්දූ මිගෙල් මැන්දිස්
- මවගේ නම - මිල්ඩෝ ද සිල්වා
- පියාගේ නම - ගිංගම ලද්දූ අසනේරිස් මැන්දිස්
- අධ්‍යාපනය ලැබූ පාසල - කොළඹ වෙස්ලි විදුහල
- උගත් භාෂා - සිංහල , ඉංග්‍රීසි , සංස්කෘත

# ක්‍රියාකාරකම - 2
# පිළිතුරු



- ධර්ම දේශනා පැවැත්වීම
- පෙරහැර සංවිධානය
- බෞද්ධ පාසල් පිහිටු වීම
- බෝධිරාජ සමිතිය පිහිටුවා බෝධි වෘක්ෂ රෝපණය
- ඕනෑම කටයුත්තක් මනාව සංවිධානය කිරීම

**ශාසනික සමාජ මෙහෙවර**

- ඉගෙනීමේ දක්ෂ බව
- කතාවෙහි චතුර බව
- පුස්කොළ පොත් සම්පාදනය
- විවිධ භාෂා පිළිබඳ දැනුම
- සුමධුර ලෙස ධර්මය දේශනා කිරීම

**හිමියන් සතු දක්ෂතා**

# ක්‍රියාකාරකම - 3
# පිළිතුරු



1. අමාවතුර
2. ගම්පෙරළිය
3. ක්‍රිස්තියානි වාද විසාතතිය
4. මඩොල් දූව
5. රිවි රැස
6. දිණමිණ
7. සද්ධර්මරත්නාවලිය
8. බුද්ධ ඇදහිල්ල
9. බැද්දේගම
10. සත්‍ය මාර්ගය



# ක්‍රියාකාරකම - 4
## පිළිතුරු

- ධනවත්
- පාරවල්
- දුබල
- වනයෙහි
- ගෙවල්වල
- සතුන්ගෙන්
- අනුගමනය
- නොමිනිස්
- පාරවල්

# ක්‍රියාකාරකම - 5
# පිළිතුරු



1. නිවහල් දේශයක් ගොඩ නැගීමට අපි ඇප කැප වෙමු . √
2. සතුන් ගෙන් ගහණ වනාන්තරයේ අපි ඇවිද ගියෙමු . ×
3. ලූලා නැති වලට කණයා පණ්ඩිතයාලු . ×
4. විල්වල මානෙල් මල් පිරී තිබුණි . √
5. මහ වැස්ස නිසා ගස් වලට නව පණක් ලැබුණි . ×
6. දූ සිරිත් වලින් ඈත් වීම යහපත් සමාජයකට මහත් පිටිවහලකි . ×
7. සුසිරිත් රැකීම අප විසින් නොවරදවා ම කළ යුත්තකි. √
8. වනයෙහි පිපි මල් පරිසරය අලංකාර කරයි . √
9. සඳ යි තරු යි රාත්‍රි අහසේ චමත්කාරජනක දසුනකි . ×
10. ගෙවල්වලට ගොස් පලතුරු විකිණීමෙන් ඔහු ජීවත් වෙයි . √

# ක්‍රියාකාරකම - 6
# පිළිතුරු



1. සමරූපතාවෙන් යනු එක් ලේඛනයක දී සැම තැන්හි ම එක් ක්‍රමයක් අනුව ලිවීමයි . √
2. සංඛ්‍යා වචනයෙන් ලියන විට පද බෙදීම පිළිබඳව සැලකීමක් අවශ්‍ය නැත . ×
3. සියයෙන් පහළ සංඛ්‍යා එක් කොට ම ලිවිය යුතුය ×
4. සියයෙන් පහළ සංඛ්‍යා එක් කොට හෝ සමරූපතාවෙන් ලිවිය හැකිය . √
5. හයදහස් හයසිය තිහ යන්න හය දහස් හය සිය තිහ ලෙසද ලිවිය හැකිය . √
6. ඉලක්කමෙන් සංඛ්‍යාවක් ලියන විට විභක්ති අකුරත් සමගම ලිවිය යුතුය . √